කැලණිය විශ්වවිද්‍යාලය
களனிப் பல்கலைக்கழகம்
UNIVERSITY OF KELANIYA

මගේ අංකය
எனது இல
My No.

ඔබේ අංකය
உமது இல
Your No.

## ලියාපදිංචි තැපැල

2023.10.10

ගරු ස්වාමීන් වහන්ස/මහත්මයාණෙනි/මහත්මියනි/මෙනෙවියනි,

**උපාධි ප්‍රදානෝත්සවය -2023 නොවැම්බර් මස 21 - පළමු සැසිය.**

කැලණිය විශ්වවිද්‍යාලයේ **දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ (බාහිර) උපාධි පරීක්ෂණ සම්පූර්ණ කිරීමෙන් උපාධිලාභී වූවන්ට** උපාධි ප්‍රදානය කිරීම සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය **2023 නොවැම්බර් මස 21 වැනි අඟහරුවාදා පෙරවරු 9.00 සිට මධ්‍යහ්න 12.00** දක්වා (පළමු සැසිය) බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වේ. මෙම උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වන ලෙස ඔබට මෙයින් සතුටින් ආරාධනය කරමි.

1. **2023.11.18 සෙනසුරාදා දින පෙරවරු 9.30 සිට මධ්‍යහ්න 12.00 දක්වා කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ පිහිටි විභාග අංශයෙන් උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු ලැබේ.** උපාධි ලෝගු සහ කරමාල භාරගැනීම සඳහා තම ශිෂ්‍ය හැඳුනුම්පත, ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය රැගෙන පැමිණිය යුතුය. **අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඉහත දැක්වෙන හැඳුනුම්පතක් ඉදිරිපත් නොකරන කිසිවෙකුට උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු නොලැබේ. උපාධි ලෝගු සහ කරමාල භාරගැනීම සඳහා උපාධිලාභියාම පැමිණිය යුතුය.**

2. උපාධිලාභි නාමලේඛනයේ ඔබගේ නමට හිමි අංකය අනුව උපාධිලාභීන් පිළිවෙළින් දෙදෙනා බැගින් උපාධිලාභීන්ගේ පෙරහැර සඳහා පෙළගැසී සිටිය යුතුය. උපාධිලාභීන්ගේ පෙරහැර ශාලාවට ඇතුළු වූ පසු පැමිණෙන උපාධිලාභීන් කිසිවෙකුටත් උපාධි ශාලාවට ඇතුළු වීමට අවසර දෙනු නොලැබේ.

3. ඔබ වෙනුවෙන් උපාධි ප්‍රදානෝත්සවය සඳහා ආරාධිතයන් **දෙදෙනෙකු** සහභාගි කරවා ගැනීමට අවස්ථාව සලසා ඇත. උපාධි ප්‍රදානෝත්සවයේ වැඩ සටහන් විස්තරය සහ ආරාධනා පත්‍ර උපාධි ලෝගු සහ කරමාල නිකුත් කරනු ලබන අවස්ථාවේදී ලබාදීමට කටයුතු යොදා ඇත.

4. උපාධි ප්‍රදානෝත්සව ශාලාව ඇතුළත **ඡායාරූප ගැනීම තහනම් වන අතර, කැමරා සහ ජංගම දුරකථන ශාලාව තුළට ගෙන ඒමටත්, වයස අවුරුදු 12 ට අඩු ළමුන් ශාලාවට ඇතුල් කිරීමටත් අවසර දෙනු නොලැබේ.**

5. උපාධි ප්‍රදානෝත්සවය අවසන් වී දින 07 ක් ඇතුළත (සෙනසුරාදා හා ඉරිදා දින හැර) උපාධි ලෝගු සහ කරමාල විශ්වවිද්‍යාලයට ආපසු භාරදිය යුතු ය. උපාධි ලෝගු සහ කරමාල භාරදීම ප්‍රමාද වන සෑම දිනයක් සඳහාම රුපියල් 50/- ක අතිරේක ගෙවීමක් කිරීමට සිදුවේ. තවද උපාධි ලෝගුවට සහ කරමාලයට කිසියම් හානියක් සිදුවුවහොත් එහි වටිනාකම සමග **අතිරේක 25% ක ගාස්තුවක්** ගෙවීමට සිදුවන බව ද මෙයින් දන්වමි.

6. උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වන පිරිමි උපාධිලාභීහු **ජාතික ඇඳුම හෝ යුරෝපීය ඇඳුම ඇඳිය යුත්තාහ. කාන්තා උපාධිලාභීන් පෙරදිග සිරිත අනුව විචිත්‍රවර්ණයෙන් හා උත්සව විලාසයෙන් පැමිණිය යුතුය.**

7. උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ ඡායාරූප ලබා ගැනීමට පහසුකම් විශ්වවිද්‍යාලය මගින් සලසා ඇත. ඡායාරූප ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා නියමිත මුදල **විශ්වවිද්‍යාලය විසින් අවසරය ලබා දී ඇති ඡායාරූප ශිල්පියා** වෙත උපාධි ලෝගු ලබාගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය.

8. උපාධි ප්‍රදානෝත්සවයට සහභාගිවන උපාධිලාභී භික්ෂූන් වහන්සේලා සඳහා විජිනිපත් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට ඇතුළුවන ප්‍රධාන දොරටුවේ වම්පස ඇති කවුන්ටරයෙන් 2023 නොවැම්බර් මස 21 වැනි අඟහරුවාදා දින පෙරවරු 8.00 ට නිකුත් කරනු ලැබේ. උපාධිලාභී පෙරහැර පෙළගැස්වීමට ප්‍රථම විජිනිපත් ලබාගත යුතු බව කරුණාවෙන් සලකන්න. උපාධි ප්‍රදානෝත්සවය අවසන් වූ පසු එම විජිනිපත්, ලබාගත් කවුන්ටරයට ම ආපසු භාරදීමට කටයුතු කරන ලෙස කරුණාවෙන් දන්වමි.

9. කැලණිය විශ්වවිද්‍යාලයේ **https://cdce.kln.ac.lk** වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ 011-2987000,011-2987001-5 දුරකථන අංක ඇමතීමෙන් වැඩි විස්තර ලබාගන්නා ලෙස කාරුණිකව දන්වමි.

මෙම ලිපිය උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි වීම සඳහා ඔබට/ඔබ වහන්සේට කෙරෙන ආරාධනයක් සේ සලකන්න.

මෙයට-විශ්වාසී,

ආර්.එම්.එම්.එල්.බී. වැවේගම
නියෝජ්‍ය ලේඛකාධිකාරී
විභාග අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව.

**ආර්.එම්.එම්.එල්.බී.වැවේගම**
**නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග**
**ලේඛකාධිකාරී වෙනුවට**

**සැ.යු :**
**උපාධි සහතිකයේ සඳහන් නම හා ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති නම අතර යම් වෙනසක් ඇත්නම් ( ප්‍රතිඵල සටහනේ අති පරිදි නම සඳහන්ව නොමැති නම්) ඒ පිළිබඳව එදිනම අදාළ කවුන්ටරයට නැවත භාර දීමට හෝ සහතිකය නිකුත් කල දින සිට දින 07 ක් ඇතුළත විභාග අංශය වෙත භාර දී නිවැරදි කර ගන්නා මෙන් අවධාරණය කර සිටිමි.**

**වි.වි.ප්‍ර.කොමිෂන් සභාව විසින් 2021.11.05 දින නිකුත් කර ඇති 09/2021 චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන මෙන් වැඩි දුරටත් දන්වා සිටිමි.**